

# පුරවැසි අධ්‍යාපනය

පළමු වාරය

# අපේ පාසල

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk
මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය

06 ශ්‍රේණිය - පළමු වාරය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

පුරවැසි අධ්‍යාපනය - 6 ශ්‍රේණිය

පළමු වාරය
ගුරු මාර්ගෝපදේශය
අපේ පාසල
ප්‍රථම මුද්‍රණය : 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
..............................................................
මුද්‍රණය හා බෙදා හැරීම

Published by : National Institute of Education

Printed By : ..........................................................................

# උපදේශනය, රචනය හා සංස්කරණය

## උපදේශනය

| | |
|---|---|
| මහාචාර්ය මංජුලා විතානපතිරණ | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය දර්ශන සමරවීර | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**අධීක්ෂණය**

| | |
|---|---|
| ඩී. එච්. සී. එන්. ධර්මපාල මිය | අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| එස්. යූ. අයි. කේ. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විෂය ව්‍යාපෘති ප්‍රධානි (පුරවැසි අධ්‍යාපනය),<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**රචනය**

| | |
|---|---|
| එස්. යූ. අයි. කේ. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විෂය ව්‍යාපෘති ප්‍රධානි<br>(පුරවැසි අධ්‍යාපනය), ජාතික අධ්‍යාපන ආයතනය. |
| පී. ටී මාරසිංහ මිය | නියෝජ්‍ය විදුහල්පති, ජනාධිපති විද්‍යාලය, කෝට්ටේ. |
| ටී. ඩී. එන්. අයි. තිලකරත්න මයා | ගුරු සේවය, බ/ දඹවින්න ශ්‍රී සරණංකර මහා විද්‍යාලය,<br>වැලිමඩ. |
| බී ප්‍රේම්ලන් මයා | ගුරු සේවය, කල්/කල්/ වෙස්ලි උසස් පාසල, කල්මුනේ. |

**සංස්කරණය**

**අභ්‍යන්තර**

| | |
|---|---|
| එස්. යූ. අයි.කේ. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>විෂය ව්‍යාපෘති ප්‍රධානි, (පුරවැසි අධ්‍යාපනය),<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය කේ. ජී. කේ. ප්‍රභාෂ් | සහකාර කථිකාචාර්ය,<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**බාහිර**

| | |
|---|---|
| එල්. එම්. වංශවතී මෙය | පීඨාධිපති (විශ්‍රාමික),<br>වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, බිංගිරිය. |
| ආචාර්ය කේ. ඒ. එන්. පුෂ්පකුමාර | කථිකාචාර්ය,<br>ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, පතන. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| පී. ඩී. එච්. ඊ. පනාගොඩ මිය | ගුරු විදුහල්පති, රජයේ ගුරු විදුහල, බළපිටිය. |

**පිටකවරය, චිත්‍ර හා පිටුසැකසුම් නිර්මාණය**

| | |
|---|---|
| කසුන් පුෂ්පික තලගල මයා | ගුරු සේවය, බප/ජය/ ශ්‍රී සෝමානන්ද මහා<br>විද්‍යාලය, කොරතොට |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා පොදු උපදෙස්

විසි එක්වන සියවස සඳහා උචිත ප්‍රබුද්ධ හා සබුද්ධික ගෝලීය පුරවැසියකු (Enlightened and Insightful Globle Citizen) බිහිකිරීම යන උතුම් පරමාර්ථය පෙරදැරි කරගනිමින් පුරවැසි අධ්‍යාපනය විෂයය සහ ඊට අදාළ මොඩියුල සම්පාදනය කර ඇත. 6 ශ්‍රේණිය සඳහා 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන මෙම මොඩියුලය තුළ එක් එක් තේමාවට අදාළ ඉගෙනුම් පල සාධනය කරගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ගොඩනගා තිබේ. වාරයකට නියමිත කාලච්ඡේද ගණන හා සමපාතවන අයුරින් ඉගෙනුම් පලයක් හෝ කිහිපයක් ආවරණය කර එක් ක්‍රියාකාරකමක් වන සේ විෂය අන්තර්ගතයට අදාළ කරුණු හා සිසු ක්‍රියාකාරකම් ඊට ඇතුළත් ව ඇත. පුරවැසි අධ්‍යාපනය විෂයයභාර ගුරුවරයා වශයෙන් ශිෂ්‍ය මොඩියුලයෙහි ඇතුළත් ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසමින් සුසාධ්‍යකරුවකුගේ භූමිකාව (Role of Facilitator) ඉටු කිරීම ඔබේ වගකීම වනු ඇත. 21වන සියවසේ ගුරුවරයකු වශයෙන් වඩාත් සුතත්‍ය ඉගෙනුම් ප්‍රවේශ (Authentic learning apporches) භාවිත කර සිසු කුසලතා සංවර්ධනය වන අයුරින් කටයුතු කිරීම ඔබෙන් අපේක්ෂා කරමු.

විෂයමාලා කමිටුව

## පටුන


| | | පිටුව |
|---|---|---|
| විෂයමාලා කමිටුව | | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා පොදු උපදෙස් | | iv |
| **පුරවැසි අධ්‍යාපනය විෂයයේ ස්වභාවය සහ ගුරු කාර්යභාරය** | | 01-08 |
| මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් වන පොදු ගුරු උපදෙස් | | 09 |
| මොඩියුලය තක්සේරුකරණය හා ඇගයීම | | 10-15 |
| විෂය නිර්දේශය | | 16-21 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | | |
| 01 | පාසල හඳුනාගනිමු | 22-26 |
| 02 | පාසල් සංස්කෘතියට අනුගත වෙමු | 27-30 |
| 03 | පාසලේ සංවිධාන ව්‍යුහය හඳුනාගනිමු | 31-34 |
| 04 | ප්‍රජාව සමග එක් වී පාසල ගොඩනගමු | 35-38 |
| 05 | අනාගත පාසලේ ස්වභාවය මනසින් ගොඩනගමු | 39-42 |
| 06 | මම මගේ ස්වභාවය හඳුනාගනිමි | 43-46 |

**පුරවැසි අධ්‍යාපනය විෂයයේ දැක්ම සහ මෙහෙවර**

දැක්ම

21වන සියවසට උචිත අභිමානවත් ප්‍රබුද්ධ හා සබුද්ධික පුරවැසියෙක්

මෙහෙවර

දේශීයත්වය අගය කරමින් වගකීම් සහ වගවීම් යන මානවීය ගුණාංග වලින් යුත් අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව සහිත තාක්ෂණ කුසලතාවලින් හෙබි විශ්වීය පුරවැසියකු ලෝකයට දායාද කිරීමයි.

## 1.0 පුරවැසි අධ්‍යාපනය විෂයයේ ස්වභාවය සහ ගුරු කාර්යභාරය

21වන සියවස තුළ මානව සමාජයේ ඇති වී තිබෙන පරිවර්තන හේතු කොට ගෙන සමාජ බලපෑම් රැසක් නිර්මාණය වී ඇත. ජාතිකත්වය ගොඩනැගීම, දේශීයත්වය අගය කිරීම, තම අනන්‍යතාව ආරක්ෂා කරගැනීම මෙන් ම සමාජ සංස්කෘතික හර පද්ධතීන් පවත්වා ගෙන යාම අභියෝගාත්මක තත්ත්වයකි. ඊට සමගාමී ව සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික ගැටලු නිර්මාණය වීම සෑම සමාජ ක්‍රමයකට ම පොදුවේ මුහුණදීමට සිදු ව ඇති අභියෝග ලෙස පෙන්වා දිය හැකි ය. පාසල කේන්ද්‍ර කර ගත් සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය විසින් සමාජ ගැටලු අවම කිරීම සඳහා ඍජුව මැදිහත් වීම කාලීන මෙන් ම ජාතික අවශ්‍යතාවකි. 21වන සියවසට උචිත පුරවැසියකු බිහිකිරීමේ වගකීම පාසල් විෂයමාලාව තුළින් අපේක්ෂා කරන අතර ඊට සමගාමී ව 2007 වර්ෂයේ දී ජීවන නිපුණතා පුරවැසි අධ්‍යාපනය විෂයය පාසල් විෂයමාලාවට ඇතුළත් කරනු ලැබීය. එය පාසල් විෂයමාලාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද "මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉදිරි දැක්ම" ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා" (2003) වාර්තාව මගින් පෙන්වා දී ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණියෙන් ආරම්භ කොට පිළිවෙළින් ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. 21වන සියවසට උචිත ගෝලීය පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය මූලික කුසලතා 12ක් මත (වගු අංක 01) පදනම්ව පුරවැසි අධ්‍යාපනය විෂයය සංවර්ධනය කර තිබේ.

**වගු අංක 01: 21වන සියවසට උචිත ගෝලීය පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය මූලික කුසලතා**

| අනු අංකය | මූලික කුසලතාව | අනු අංකය | මූලික කුසලතාව |
|---|---|---|---|
| 01 | විචාරාත්මක චින්තනය | 07 | තාක්ෂණික සාක්ෂරතාව |
| 02 | නිර්මාණශීලීත්වය | 08 | නම්‍යශීලීබව |
| 03 | සාමූහිකත්වය | 09 | නායකත්වය |
| 04 | සන්නිවේදනය | 10 | ආරම්භක කුසලතා |
| 05 | තොරතුරු සාක්ෂරතාව | 11 | ඵලදායිතාව |
| 06 | මාධ්‍ය සාක්ෂරතාව | 12 | සමාජයීය කුසලතා |

21වන සියවසට උචිත ගෝලීය පුරවැසියකු බිහිකිරීමට අවශ්‍ය මූලික කුසලතා 12 මත පදනම් ව පුරවැසි අධ්‍යාපනය විෂයය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප (Essential Learning Concepts) හතක් (07) ගොඩනගා ඇත. එය රූප සටහන 01 මඟින් දැක්වේ.

රූප සටහන 01: *පුරවැසි අධ්‍යාපනය විෂයමාලාව ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප*



එම අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තවදුරටත් විස්තාරණය කරමින් 6 - 9 සහ 10 - 11 ශ්‍රේණි සඳහා වෙන් වෙන් ව සූචක දෙකක් ද (Descriptors) ස්ථර සූචක (Descriptor Levels) හත (07) බැගින් ද ගොඩනගා ඇත. 6 - 9 ශ්‍රේණි සඳහා වසරකට තේමා තුනක් (03) වශයෙන් තේමා 12කින් හා 10 ශ්‍රේණිය සඳහා වසරකට තේමා හතරක් (04) ද 11 ශ්‍රේණිය සඳහා වසරකට තේමා තුනක් (03) වන සේ තේමා හතකින් (07) ද යුක්ත ව සමස්ත තේමා 19ක් වශයෙන් පුරවැසි අධ්‍යාපනය විෂයමාලාව සංවර්ධනය කර ඇති ආකාරය වගු අංක 2 මගින් නිරූපණය කර තිබේ

වගු අංක 02
ශ්‍රේණි අනුව තේමා විස්තාරණය

| 6 ශ්‍රේණිය | 7 ශ්‍රේණිය | 8 ශ්‍රේණිය | 9 ශ්‍රේණිය | 10 ශ්‍රේණිය | 11 ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| අපේ පාසල | පවුල හා ජන සමාජය | සංස්කෘතියට අනුගත ව වැඩලෝකය ජය ගැනීම | තාක්ෂණය හා වැඩලෝකය | ගෝලීය පුරවැසියා | ආණ්ඩුව සහ නීතිගරුක පුරවැසියා |
| අපේ මාතෘභූමිය | පුරවැසි යුතුකම් | ගැටලු විසඳීම හා ඵලදායී තීරණ ගැනීම | ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසි භූමිකාව | ශ්‍රී ලංකාවේ පාලන ව්‍යුහය | මානව හිමිකම් සහ යුතුකම් |
| ජීවිතයට නීතිය | ළමයා හා නීතිය | පරිසරය හා නීතිය | නීතිය හා සමාජ සුරක්ෂිතතාව | පුරවැසියා හා නීතිය | ජාත්‍යන්තර සබඳතා |
| | | | | වැඩලෝකය සහ ශ්‍රී ලංකාවේ නව ආර්ථික ප්‍රවණතා | |

# අධ්‍යාපනයේ විවිධ පාර්ශ්වකරුවන් හා සම්බන්ධ සුසමාදර්ශය විතැන්වීමේ (Paradigm Shift) ස්වභාවය

**විසි එක් වන සියවසේ ශිෂ්‍යයා**

විසි එක්වන සියවසට අවැසි කුසලතා ප්‍රගුණ කළ ශිෂ්‍යයා සමෝධානිත පෞරුෂයකින් යුත් අයෙකු විය යුතුය. ඔහු තම කැමැත්ත හා ආශාව අනුව ඉගෙනීමට යොමු වන අතර දැනුම සොයා යාමට ඇල්මක් දක්වයි. ගැටලු මූලික ඉගෙනුම, ව්‍යාපෘති පාදක ඉගෙනුම මෙන්ම කණ්ඩායම් තුළ ඉගෙනුමට බහුල වශයෙන් යොමු වේ

**විසි එක් වන සියවසේ පන්ති කාමරය**

පන්ති කාමරය සෑම විට ම සිසුන් තුළ විචාරාත්මක චින්තනය, සහයෝගී බව, සන්නිවේදන හැකියාව සහ නිර්මාපීබව ප්‍රවර්ධනයට මඟ පෙන්වන ඉගෙනුම් පරිසරයකින් සමන්විත වේ. එමගින් සිසුන්ගේ තොරතුරු සාක්ෂරතාව, මාධ්‍ය සාක්ෂරතාව සහ තාක්ෂණ සාක්ෂරතාව යන කුසලතා සංවර්ධනය ශක්තිමත් කරයි. එමෙන්ම ජීවන කුසලතා සහ වෘත්තීය කුසලතා සඳහා පදනමක් සැපයීමට පන්ති කාමර හා පන්ති කාමරයෙන් බැහැර නිදහස් ඉගෙනුම් අවස්ථා ක්‍රියාත්මක වේ. පන්තිකාමරය සෑමවිට ම නම්‍යශීල, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේ ද බහුලව යොදා ගැනෙන අතර නව තාක්ෂණය භාවිතයට ද ප්‍රමුඛත්වයක් හිමි වේ.

**විසි එක් වන සියවසේ ගුරුවරයා**

ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා යොමු වූ මාර්ගෝපදේශකත්වයක් ගුරුවරයාගේ පාර්ශ්වයෙන් සම්පාදනය කළ යුතුය. එමඟින් ශිෂ්‍යයාට ස්වයං ඉගෙනුම් අවස්ථා ලබාදෙමින් හැකි සෑම අවස්ථාවක ම ප්‍රජාව සමඟ බද්ධවීමෙන් අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු වේ. ශිෂ්‍යයා පෙර දැනුමක් සහිතව ඉගෙනීමට යොමු වන බැවින් එම අත්දැකීම් පාදක කර ගනිමින් කණ්ඩායම තුළ දී මෙන්ම කණ්ඩායම් අතර ද සහයෝගයෙන් ඉගෙනුමෙහි යෙදීමට අවස්ථා සලසා දිය යුතු වේ.

**විසි එක් වන සියවසේ විදුහල්පති**

විදුහල්පති විසි එක් වන සියවසේ කුසලතා තමන් තුළ ගොඩනංවා ගැනීම සඳහා වූ මානසික ශක්‍යතාවකින් හෙබි අයෙකු මෙන්ම එම කුසලතා ප්‍රගුණ කර ගත් නායකයකු වීම අත්‍යවශ්‍ය ය. ඔහු එම කුසලතාවලින් ගුරු - සිසු දෙපාර්ශ්වයම බලගැන්වීම සඳහා සැලසුම් කිරීම සංවිධානය කිරීම සහ මාර්ගෝපදේශකත්වය සැපයීමේ භූමිකාවට අනුගත විය යුතුය. ඒ සඳහා නම්‍යශීලී සහ ප්‍රජාතාන්ත්‍රවාදී මෙන්ම මෘදු කුසලතාවලින් පිරිපුන් නායකයකු බව ක්‍රියාවෙන් සහ පැවැත්මෙන් ආදර්ශනය කළ යුතුය.

**විසි එක් වන සියවසේ පාසල**

විසි එක් වන සියවසේ පාසල ශක්තිමත් නායකත්වයක් (Strong Leaders) සහ සහයෝගී අනුගාමීකත්වයක් ලබා දෙන ආත්ම විශ්වාසයෙන් යුත් ගුරුවරුන්ගෙන් (Confident Teachers) මෙන්ම පාසලේ ගුණාත්මක සංවර්ධනය සඳහා ක්‍රියාකාරි දායකත්වයකින් කටයුතු කරන ප්‍රජාවකගෙන් සමන්විත වීම අත්‍යවශ්‍ය වේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙන්ම අනෙකුත් ක්‍රියාකාරකම්වල දී නවෝත්පාදන ප්‍රවේශවලට (Innovative Approaches) යොමුවීමේ අවස්ථා උදාකර ඇති සහෝදර පාසල් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ශක්තිමත්ව පවත්වාගෙන යමින් අත්දැකීම් හා සම්පත් හුවමාරු කර ගැනීම, සමානාත්මතාවයෙන් හා සහෝදරත්වයෙන් සැලකීම වැනි උසස් මානව ගුණාංග ඔප්නංවා ගැනීම සඳහා ක්‍රියා කිරීමට අපේක්ෂා කෙරේ.

යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ පුළුල් පරමාර්ථය සාක්ෂාත්කරණයෙහිලා විෂයමාලා ප්‍රතිසංස්කරණයෙන් රටේ දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීම සඳහා සක්‍රීය ව දායකවන, ස්වයං අභිමානයෙන් යුත්, දේශහිතෛෂී, ගෝලීය සංස්කෘතික සාක්ෂරතාව ප්‍රගුණ කර ගත් සහකම්පන ගුණයෙන් යුත් සිසු පිරිසක් සමාජ ගත කිරීම උදෙසා වූ සවිබලගැන්වීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව, පුරවැසි අධ්‍යාපනය විෂයය 21 වන සියවසට උචිත ගෝලීය පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය මූලික කුසලතා මත පදනම්ව අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප (Essential Learning Concepts) හතක් (07) ඔස්සේ සංවර්ධනය කර ඇත. එම අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තවදුරටත් විස්තාරණය කරමින් 6 - 9 ශ්‍රේණි සඳහා වසරකට තේමා තුන (03) බැගින් තේමා 12 කින් හා 10වන ශ්‍රේණිය සඳහා තේමා හතරක් ද (04) ද 11වන ශ්‍රේණිය සඳහා තේමා තුනක් (03) ලෙස සේ සමස්ත තේමා 19 ක් වශයෙන් විෂයය සමන්විත වේ. දේශීයත්වය අගය කරමින් වගකීම් සහ වගවීම් යන මානවීය ගුණාංගවලින් පිරිපුන් අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව සහිත තාක්ෂණ කුසලතාවලින් හෙබි විශ්වීය පුරවැසියකු ලෝකයට දායාද කිරීම මෙම විෂයයෙන් අපේක්ෂිත ය. එමගින් ප්‍රජාතන්ත්‍රීය පාලනයට අනුගතව බහුවිධ සමාජ ක්‍රමයක අභිමානවත් පුරවැසියකු ලෙස සමාජ යහපැවැත්ම උදෙසා සක්‍රියව දායක වීම, තම මාතෘභූමියේ උන්නතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් සක්‍රියව කැපවීම, නීතිගරුක පුරවැසියකු ලෙස තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම, තිරසර සංවර්ධනය වෙනුවෙන් ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම්වල නිරතවීම සහ විචාරශීලී චින්තනයෙන් යුතුව තම ජීවන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන පුරවැසි දැනුම, පුරවැසි ආකල්ප සහ පුරවැසි කුසලතා සංවර්ධනයට මාර්ගෝපදේශකත්වය මෙන්ම සුසාධ්‍යකරණය සිදු කරනු ලැබේ.




රූප සටහන 02 - පුරවැසි අධ්‍යාපනය විෂය තේමා ගොඩනැගීමට අදාළ න්‍යායාත්මක පසුබිම

## 2.0 ජාතික අධ්‍යාපන අභිමතාර්ථ

තිරසර ජාතික සංවර්ධනය මෙන් ම තිරසර සාමය ස්ථාපිත කිරීම උදෙසා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දෙන්නා වූ 21වන සියවස හා ඉන් ඔබ්බට වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි පුරවැසියකු බිහි කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණයේ මූලික පරමාර්ථයකි. (National Curriculum Framework For General Education In Sri Lanka 2020" MoE). එම පුළුල් පරමාර්ථය සාක්ෂාත්කරණය උදෙසා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රධාන අභිමතාර්ථ අටක් (08) සම්පාදනය කර ඇත (National Education Policy Framework (2020- 2030), 2022, NEC) එය වගු අංක 03 හි දැක්වේ

වගු අංක 3 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2022) අනුව ජාතික අධ්‍යාපන අභිමතාර්ථ

| NEG Number | National Education Goals | Condensed Form |
|---|---|---|
| NEG 1 | Promote the physical, mental, spiritual, socioemotional, and environmental well-being of individuals necessary for a healthy and happy way of life, based on respect for human values. | Happy and healthy human being |
| NEG 2 | Develop knowledge, skills, attitudes, and human qualities for technological, socio-economic, and cultural advancement, in keeping with national needs and global trends. | Productive individual |
| NEG 3 | Develop productive individuals with curiosity, critical thinking, problem-solving skills, creativity, and innovativeness. | Progressive learner |
| NEG 4 | Promote respect for human rights and laws of the country, while fulfilling duties and obligations in keeping with the norms of social justice and democratic way of life. | A respectful and trustworthy person |
| NEG 5 | Develop individuals to manage change and cope with complex and unforeseen situations. | Resilient individual |
| NEG 6 | Uphold the nation's cultural and ecological heritage while responding to local and global challenges. | Culturally rooted ambassador |
| NEG 7 | Promote a mindful and self-conscious learner to enhance the capacity for learning to learn. | Reflective learner |
| NEG 8 | Develop a patriotic Sri Lankan citizen fostering national cohesion, national integrity, and national unity while respecting cultural diversity. | Patriotic citizen |

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2022) අනුව ජාතික අධ්‍යාපන අභිමතාර්ථ (සිංහල පරිවර්තනය)

## ජාතික අධ්‍යාපන අභිමතාර්ථ

1. මානව සාරධර්මවලට ගරු කිරීම මත පදනම් ව සෞඛ්‍ය සම්පන්න ප්‍රීතිමත් ජීවන රටාවක් සඳහා අවශ්‍ය වන්නා වූ පුද්ගලයින්ගේ ශාරීරික, මානසික, ආධ්‍යාත්මික, සමාජ චිත්තවේගීය සහ පාරිසරික යහපැවැත්ම ප්‍රවර්ධනය.

2. ජාතික අවශ්‍යතා සහ ගෝලීය ප්‍රවණතාවලට අනුකූල ව තාක්ෂණික, සමාජ, ආර්ථික සහ සංස්කෘතික ප්‍රගමනය උදෙසා දැනුම, කුසලතා, ආකල්ප මෙන් ම මානව ගුණාංග සංවර්ධනය කිරීම.

3. විචාරාත්මක චින්තනය, කුතුහලය, ගැටළු විසඳීමේ කුසලතා, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන හැකියා සහිත ඵලදායී පුද්ගලයෙක් බිහි කිරීම.

4. සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට අනුකූල ව යුතුකම් මෙන් ම වගකීම් ඉටුකිරීමත්, මානව හිමිකම් සහ නීතිරීතිවලට ගරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

5. වෙනස්කම් කළමනාකරණය කර ගනිමින් හදිසි සහ සංකීර්ණ අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණුදිය හැකි පුද්ගලයකු බිහි කිරීම.

6. දේශීය හා ගෝලීය අභියෝගවලට සාර්ථක ව ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලාංකීය පාරිසරික සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම.

7. ස්වයං දැනුවත්බවින් මෙන 'ම සවිඥානිකබවින් යුතු ව ඉගෙනුමට ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා උචිත පුද්ගලයකු බිහිකිරීම.

8. සංස්කෘතික විවිධත්වයට ගරුකරමින් ජාතික සහජීවනය, ජාතික ඒකාග්‍රතාවය, ජාතික සමගිය පෝෂණය කරමින් දේශප්‍රේමී ශ්‍රී ලාංකීය පුරවැසියකු බිහිකිරීම.

## පුරවැසි අධ්‍යාපනය 6 - 11 ශ්‍රේණි විෂයය අරමුණු

1. ප්‍රජාතන්ත්‍රීය පාලනයට අනුගත වෙමින් බහුවිධ සමාජ ක්‍රමයක අභිමානවත් පුරවැසියකු ලෙස සමාජ යහපැවැත්ම උදෙසා සක්‍රිය ව දායක වීම.
2. තම මාතෘභූමියේ උන්නතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් සක්‍රිය ව දායක වෙමින් ගෝලීය පුරවැසි කුසලතා සංවර්ධනය කර ගැනීම.
3. නීතිගරුක පුරවැසියකු ලෙස තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් සුරක්ෂිත සමාජයක් ස්ථාපිත කිරීමට යොමු වීම.
4. ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම්වල නිරතවෙමින් සාර්ථක ජීවන ඉලක්ක ගොඩනගා ගැනීම හා තිරසර සංවර්ධනය වෙනුවෙන් සක්‍රීය ව දායක වීම.
5. හදිසි හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණදෙමින් විචාරශීලී චින්තනයෙන් යුතු ව තම ජීවන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම.

# 3.0 පුරවැසි අධ්‍යාපනය විෂයයේ ප්‍රධාන සූචක සහ ස්ථර සූචක කනිෂ්ඨ ද්විතියික (6 - 9) අවධිය

කනිෂ්ඨ ද්විතියික (6 - 9) අවධිය අවසානයේ දී ශිෂ්‍යයා විසින් ළඟා කර ගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් කුසලතා, සූචකය මගින් ද, එම ඉගෙනුම් කුසලතා අත්පත් කර ගැනීම සඳහා සපුරාලිය යුතු සුවිශේෂ ගුණාංග ස්ථර සූචක මගින් ද නිරූපණය වේ. එය වගු අංක 04 මගින් දැක්වේ.

වගු අංක - 04 පුරවැසි අධ්‍යාපනය විෂයයේ ප්‍රධාන සූචක සහ ස්ථර සූචක කණිෂ්ඨ ද්විතියික (6 - 9 ශ්‍රේණි) අවධිය

| සූචක (Descriptors) | ස්ථර සූචක (Level Of Descriptors) |
|---|---|
| බහු සංස්කෘතික සමාජයක යුතුකම් සහ වගකීම් ඉටු කරමින් මානව ගරුත්වය සුරකින්නා වූත් කාලීන සමාජ වෙනස්වීම්වලට අනුගත ව ඵලදායී තීරණ ඇසුරින් ගැටුම් අවම කිරීමට දායකවන්නා වූත් වැඩලෝකයට පිවිසීමේ කුසලතාවලින් හෙබි දේශහිතෙෂී නීතිගරුක පුරවැසියකුගේ භූමිකාව ඉටු කරයි. | ▪ යුතුකම් සහ වගකීම් හඳුනා ගෙන ඒවා නොපිරිහෙලා ඉටු කිරීමත්, අයිතිවාසිකම් භුක්තිවිඳීමත් තුළින් තමා, තම ආසන්න පරිසරය හා සමාජය මෙන් ම මාතෘභූමියේ උන්නතිය උදෙසා වන සක්‍රීය පුරවැසි භූමිකාව අර්ථාන්විත කිරීමට, |
| | ▪ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පැවැත්ම මෙන් ම සමාජ අභිවෘද්ධිය උදෙසා යොදා ගැනීමෙන් බහු සංස්කෘතික පරිසරයක් තුළ ක්‍රියාශීලී සහභාගිත්ව කුසලතා ප්‍රගුණ කිරීමට, |
| | ▪ ජන සමාජයේ සාමාජිකයකු ලෙස හිතකර හා අහිතකර සමාජ බලවේග හඳුනා ගනිමින් විවිධ අනපේක්ෂිත අවස්ථාවන්ට ශක්තිමත් ව මුහුණදීමේ හැකියාව ඇති මානව දයාවෙන් යුක්ත පුද්ගල කුසලතා සංවර්ධනය කර ගැනීමට, |
| | ▪ පුද්ගලයා, සමාජය හා පරිසරය යන ක්ෂේත්‍රවල උන්නතිය උදෙසා වන නීති හඳුනාගනිමින් පුරවැසි භූමිකාවට අනුගත ව සමාජ සුරක්ෂිතතාව ගොඩනැගීමට සක්‍රීය දායකත්වය ලබා දීමට, |
| | ▪ තම ප්‍රදේශයේ භෞතික හා මානව සම්පත් ඵලදායී ලෙස ජාතික සංවර්ධනයට යොදා ගැනීමේ පුරවැසි භූමිකාවට අනුගතවෙමින් තිරසර සංවර්ධනය උදෙසා සක්‍රීය ව දායකවීමේ කුසලතා සංවර්ධනය කර ගැනීමට, |
| | ▪ බහු සංස්කෘතික සමාජයක සාමාජිකයකු ලෙස පාසල, සමාජය සහ වැඩ ලෝකය තුළ සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් සංස්කෘතික උරුම හා දායාද ආරක්ෂා කර ගැනීමේ ස්වයං පෙළඹුම් කුසලතා සංවර්ධනය කර ගැනීමට, |
| | ▪ තම මාතෘභූමිය පිළිබඳ උත්තුංග හැඟීමෙන් යුතු ව එහි අනන්‍යතාව සුරක්ෂිත කරමින් ජාතික සංවර්ධනය වෙනුවෙන් සක්‍රීය පුරවැසියකු ලෙස ක්‍රියා කිරීමට,<br><br>හැකියාව ලැබෙනු ඇත. |

## මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් වන පොදු ගුරු උපදෙස්

### පෙර පිරික්සුම

තේමාවට අදාළ ව ශිෂ්‍යයා තුළ පවතින පූර්ව දැනුම මෙන් ම එහි භාවිතයන් සහ වැදගත්කම පිළිබඳ ව උනන්දුව ඇති කිරීමේ අරමුණින් මොඩියුලය ආරම්භයේ දී පෙර පිරික්සුමක් ඇතුළත් කර තිබේ. එය ස්වයං පෙළඹුමක ආකාරයෙන් ශිෂ්‍යයා විසින් ඉටු කිරීම ප්‍රමාණවත් වන අතර කිසිදු අවස්ථාවක දී තේමාව පිළිබඳ ව ශිෂ්‍යයා තුළ පවතින සාධන මට්ටම තක්සේරු කිරීම සඳහා යොදා නො ගත යුතු ය. ශිෂ්‍යයා විසින් පිළිතුරු සපයන ලද පෙර පිරික්සුම ඔබ විසින් පරීක්ෂා කර බලා අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ සපයමින් තේමාවට අදාළ ක්‍රියාකරකම්වල සතුටින් නිරතවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ඔබෙන් අපේක්ෂා කෙරේ.

### සාරාංශය

සෑම ක්‍රියාකාරකමක් ම අවසානයේ එම ක්‍රියාකාරකමට අදාළ ඉගෙනුම් පල සහ ඊට අයත් විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි සාරාංශ සටහනක් යොදා ඇත. එමගින් ශිෂ්‍යයා විසින් ස්වයංව හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ඔස්සේ ළගා කර ගත් තොරතුරු, විෂායානුබද්ධ කරුණු, ප්‍රායෝගික අත්දැකීම් වැනි දෑ තවදුරටත් තහවුරු කර ගැනීම උදෙසා සාරාංශය ප්‍රයෝජනයට ගත හැකි ය. ක්‍රියාකාරකමේ නිරතවීමට පළමු ව සාරාංශය පරිශීලනය කරමින් ශිෂ්‍යයා විසින් කටයුතු කිරීම මෙහිදි අපේක්ෂා නොකෙරේ.

### ස්වයං තක්සේරුව හා වැඩිදුර ඉගෙනුම් ක්‍රියාකාරකම්

පියවර කිහිපයකින් සමන්විත වන පරිදි ශිෂ්‍ය මොඩියුලයෙහි සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ඇත. සමස්ත ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයා විසින් ලබා ගත් විෂය අත්දැකීම්, ප්‍රායෝගිකත්වය හා ගලපමින් තවදුරටත් තහවුරු කරලීම අරභයා සාරාංශය අවසානයේ දී ස්වයං තක්සේරුවක් සහ වැඩිදුර ඉගෙනුම සඳහා කළ යුතු පැවරුමක් ලබා දී ඇත. සෑම සිසුවකු ම එහි නිරත කරලීම, පවතින අඩුපාඩු හඳුනා ගැනීම, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකාර්ය ඉගැන්වීම් සිදු කිරීම ඔබ සතු වගකීම වේ

## පළමු වාරයට අදාළ ව මොඩියුල ක්‍රියාකාරකම් තක්සේරුකරණය හා ඇගයීම

පළමු වාරයට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී එක් එක් තක්සේරු අවස්ථාව සඳහා දී ඇති නිර්ණායක පදනම් කර ගනිමින් සිසුන් වෙත ලකුණු පිරිනමන්න. "අපේ පාසල" යන පළමු තේමාවට අදාළ මොඩියුලයේ ඇතුළත් තක්සේරු අවස්ථා හය සහ ඊට හිමි උපායාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය පහත වගු අංක 05 යටතේ දක්වා ඇත.

වගු අංක 05 - පළමු වාරයට අදාළ ක්‍රියාකාරකම් හා ඊට අදාළ තක්සේරු ලකුණු

| තේමාව | ක්‍රියාකාරකම | ලබා ගත හැකි ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අපේ පාසල | පාසල හඳුනාගනිමු | 20 |
| | පාසල් සංස්කෘතියට අනුගතවෙමු | 20 |
| | පාසල් සංවිධාන ව්‍යුහය හඳුනාගනිමු | 16 |
| | ප්‍රජාව සමඟ එක්වී පාසල ගොඩනගමු | 20 |
| | අනාගත පාසලේ ස්වභාවය මැනවින් මනසින් ගොඩනගමු | 16 |
| | මම මගේ ස්වභාවය හඳුනාගනිමි | 20 |
| එකතුව | | 112 |

මොඩියුලයට අදාල ව ලකුණු මඟින් සම්බාර (Credit) අගය තීරණය කරනු ලැබේ. එම සම්බාර (Credit) අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව (Formative Assessment) හා සම්පිණ්ඩිත ඇගයීම (Summative Evaluation) යොදා ගනු ඇත. එහි බර තැබීම පහත පරිදි වේ.

- සම්භවන තක්සේරුව - 70%
- සම්පිණ්ඩිත ඇගයීම - 30%

**සම්භවන තක්සේරුව (70%)**

සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ ඇතුළත් අංක 1 සිට 6 දක්වා වන ක්‍රියාකාරකම් යොදා ගන්න. එක් එක් ක්‍රියාකාරකම මගින් සාක්ෂාත් කර ගනු ඇතැයි අපේක්ෂා කරන ඉගෙනුම් පල පිළිබඳ සැලකිලිමත් වෙමින් නිර්ණායක මූලික ව ගොඩනගා ඇති රූබ්‍රික් (Rubric) අනුව ශිෂ්‍යයා තක්සේරු කරන්න. තක්සේරු ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේ දී අංක 06 වගුව නිදර්ශනයට ගන්න.

අංක 06 වගුව (භාවිතයේ පහසුව සඳහා සවිස්තරාත්මක ලේඛනයක් ඇමුණුම - 2 හි දක්වා ඇත)

| අනු අංකය | ශිෂ්‍ය/ ශිෂ්‍යාවගේ නම | නිර්ණායකය 1 | | | | නිර්ණායකය 2 | | | | නිර්ණායකය 3 | | | | නිර්ණායකය 4 | | | | නිර්ණායකය 5 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **20** |
| 01 | A | 4 | | | | | 3 | | | 4 | | | | 4 | | | | | 3 | | | 18 |
| 02 | B | 4 | | | | 4 | | | | 4 | | | | | 3 | | | 4 | | | | 19 |
| 03 | C | | 3 | | | | | 2 | | | 3 | | | | 3 | | | 4 | | | | 15 |

නිර්ණායක 05ක් ගොඩනගා ඇති ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 20ක් හා නිර්ණායක 04ක් ගොඩනගා ඇති ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 16ක් ද වනසේ එක් එක් තක්සේරු ක්‍රියාකාරකම සඳහා ලකුණු ගණනය කර ඇත. ඒ අනුව මොඩියුලයේ අන්තර්ගත තක්සේරු ක්‍රියාකාරකම් අංක 1, 2, 4 සහ 6 සඳහා ලකුණු 20ක් වශයෙන් ද. 3 සහ 5 සඳහා ලකුණු 16ක් වශයෙන් ද සමස්ත ලකුණු 112ක් හිමි වේ.

තක්සේරු ක්‍රියාකාරකම් 06 සඳහා එක් එක් ශිෂ්‍යයා විසින් උපයා ගත් මුලු ලකුණු 70% වශයෙන් බර තැබීම සිදු කරන්න. ඒ සඳහා පහත සූත්‍රය භාවිත කළ හැකි ය.

මොඩියුලය අවසානයේ ශිෂ්‍යයා විසින් ලබා ගත් සම්භවන ලකුණ $= \frac{X}{112} \times 70$

(X යනු **මොඩියුලයට අදාළව ශිෂ්‍යයා විසින් උපයාගත් ලකුණුවල එකතුව**)

සම්භවන තක්සේරුව සඳහා අඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා සිසුන්ට අවස්ථා කිහිපයක දී වුවත් නැවත නැවත තක්සේරු ක්‍රියාකාරකමේ නිරතව ඉහළ ලකුණක් කරා ලඟා විය හැකිය. ඒ සඳහා සිසුන්ට අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ මඟපෙන්වීම් ලබාදීම ඔබගේ වගකීම වේ.

**සම්පිණ්ඩිත ඇගයීම (30%)**

මොඩියුලයේ සමස්ත ක්‍රියාකාරකම් පාදක කර ගනිමින් සම්පිණ්ඩිත ඇගයීම සිදු කරන්න. සුදුසු ශිල්ප ක්‍රමයක් යොදා ගනිමින් විෂය අන්තර්ගතය පරික්ෂා කිරීමට ඔබට පිළිවන. (උදා: විද්‍යුත් සමර්පණ ඉදිරිපත් කිරීම, ව්‍යුහගත රචනා ප්‍රශ්න. පැවරුම්, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ වැනි) ඒ සඳහා එක් ශිෂ්‍යයකුට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය 30% කි.

මෙම මොඩියුලයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 100ක් වේ. අංක 07 වගුවේ දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන එය ගණනය කරන්න. එක් එක් ශිෂ්‍යයා ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රතිශතයට (%) අදාළ ශ්‍රේණිය (Letter Grade) හා ඊට අයත් GPV (Grade Point Value) අගය තිරණය කර ගැනීමට ඇමුණුම් 1 උපයෝගී කර ගත යුතුය. අවසාන ලකුණ ගණනයට සහ සම්භාරය (Credit) තීරණය කිරීම සඳහා ඇමුණුම 3 ට ඇතුළත් අවසන් ලකුණු ගණනය කිරීමේ ලේඛනය භාවිත කරන්න.

අංක 07 වගුව (භාවිතයේ පහසුව සඳහා සවිස්තරාත්මක ලේඛනයක් ඇමුණුම - 3 හි දක්වා ඇත)

| අනු අංකය | ශිෂ්‍ය/ ශිෂ්‍යාවගේ නම | Formative assessment -70% | | | | | | | | Summative Evaluation 30% | මුළු ලකුණු 100% (70%+30%) | ශ්‍රේණිය (Letter Grade) | Grade Point Value (GPV) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AC-1 | AC-2 | AC-3 | AC-4 | AC-5 | AC-6 | Total marks 112 | 70% | | | | |
| | | 20 | 20 | 16 | 20 | 16 | 20 | | | | | | |
| 01 | | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | | |

ඇමුණුම - 1

| Marks | Letter Grades | Grade Point Value | Remarks | Credits Earned |
|---|---|---|---|---|
| 80-100 | A | 4.00 | Excellent | Yes |
| 75-79 | A- | 3.67 | Extremely Good | Yes |
| 70-74 | B+ | 3.33 | Very Good | Yes |
| 65-69 | B | 3.00 | Good | Yes |
| 60-64 | B- | 2.67 | Fairly Good | Yes |
| 55-59 | C+ | 2.33 | Satisfactory | Yes |
| 50-54 | C | 2.00 | Quite Satisfactory | Yes |
| 45-49 | D | 1.67 | Poor | No |
| 40-44 | D- | 1.33 | Very Poor | No |
| 35-39 | E | 1.00 | Extremely Poor | No |
| 0-34 | F | 0.00 | Failed | No |

ඇමුණුම - 2

## මොඩියුල ක්‍රියාකාරකම් සඳහා ලකුණු ගණනය කිරීමේ ලේඛනය

විෂය :

ශ්‍රේණිය :

වාරය :

මොඩියුලය :

ඉගෙනුම් පල :

ක්‍රියාකාරකම :

| ඇතු අංකය | ශිෂ්‍ය/ ශිෂ්‍යාවගේ නම | නිර්ණායකය 1 | | | | නිර්ණායකය 2 | | | | නිර්ණායකය 3 | | | | නිර්ණායකය 4 | | | | නිර්ණායකය 5 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 20 |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

ඇමුණුම - 3

## මොඩියුලය සඳහා අවසන් ලකුණු ගණනය කිරීමේ ලේඛනය

විෂය :

ශ්‍රේණිය :

වාරය :

මොඩියුලය :

| ඇතු අංකය | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | Formative Assessment -70% | | | | | | | | Summative Evaluation 30% | මුළු එකතුව 100% (70%+30%) | ශ්‍රේණිය (Letter Grade) | Grade Point Value(GPV) | සම්භාරය (Credit ) Yes/No |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Activity | | | | | | Total marks 112 | 70% | | | | | |
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | | | | |
| | | 20 | 20 | 16 | 20 | 16 | 20 | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

පුරවැසි අධ්‍යාපන විෂයයෙහි ඉගෙනුම් ඉගැන්වීම් සඳහා 21වන සියවසේ ගුරුවරයෙකුට යොදා ගත හැකි සුතත්‍ය ඉගෙනුම් ක්‍රම (Authentic Learning) කිහිපයක් නිදසුන් වශයෙන් දක්වා ඇත.

| | |
|---|---|
| සිද්ධි පාදක (Case Based Study) | සාක්ෂි පාදක ක්‍රියාකාරකම් (Evidence Based) |
| පර්යේෂණ පාදක (Research Based) | පෝස්ටර්, රූපික සටහන්, අත් පත්‍රිකා |
| ක්‍රීඩා පාදක (Game Based) | බුද්ධි මණ්ඩල සාකච්ඡා (Discussion) |
| විද්‍යුත් සමර්පණ ඉදිරිපත් කිරීම (PPT) | ප්‍රදර්ශන කුටි (Gallery walk) |

6 ශ්‍රේණියට අදාළ ව සංවර්ධන කර ඇති ඉගෙනුම් පල හා බැදුණු කාර්ය සාධන ප්‍රමිති, විෂය සන්ධාරය, තක්සේරුකරණ ක්‍රියාකාරකම් හා තක්සේරු නිර්ණායක පහත වගු අංක 08 දක්වා ඇත.

වගු අංක 8 : ඉගෙනුම් පල හා බැඳුණු විෂය සන්ධාරය, කාර්ය සාධන ප්‍රමිති, තක්සේරුකරණ ක්‍රියාකාරකම් හා තක්සේරු නිර්ණායක

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| අපේ පාසල | තම පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇසුරින් පාසල් පැතිකඩ නිර්මාණය කරයි. | ■ විධිමත් සංවිධානයක් ලෙස පාසල හඳුනා ගැනීම<br>■ විධිමත් සංවිධානයක් වශයෙන් පාසලේ සුවිශේෂීත්වය<br>■ පාසලේ කාර්යභාරය<br>■ තම පාසල පිළිබඳ මූලික තොරතුරු<br>- පාසලේ නම<br>- පාසලේ ලිපිනය<br>- දුරකථන අංකය<br>- විද්‍යුත් ලිපිනය<br>- පාසලේ අනන්‍යතා අංකය<br>- පාසල් සංගණන අංකය<br>- පාසල් වර්ගය<br>- අධ්‍යාපන කොට්ඨාසය<br>- අධ්‍යාපන කලාපය<br>- ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය<br>- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය<br>- දිස්ත්‍රික්කය<br>- පළාත<br>■ පාසල පිළිබඳ පසුබිම් තොරතුරු<br>- ආරම්භක වර්ෂය<br>- පාසලේ නිර්මාතෘවරු<br>- සුවිශේෂී සන්ධිස්ථාන (උදා: ජාතික පාසලක් වීම වැනි) | ■ විධිමත් සංවිධානයක් ලෙස පාසලේ සුවිශෙෂතා පැහැදිලි කරයි.<br>■ පාසල පිළිබඳ මූලික තොරතුරු සපයා ගැනීමට උපකාරීවන ප්‍රධාන ලේඛන සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.<br>■ පාසල පිළිබඳ පසුබිම් තොරතුරු ගවේෂණයෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් පැහැදිලි කරයි. | තම පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇසුරින් පාසල් පැතිකඩ නිර්මාණය කිරීම<br>■ විධිමත් සංවිධානයක ලක්ෂණ පාසල තුළ පිළිබිඹු වන ආකාරය අන්තර්ගත ව පැවතීම<br>■ පාසලෙන් ඉටුවන ප්‍රමුඛ කාර්යයන් පැහැදිලි ව දැක්වීම<br>■ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම<br>■ දත්ත හා තොරතුරුවල ගුණාත්මක හා ප්‍රමාණාත්මකබව<br>■ සාමූහික ව කටයුතු කිරීම |

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| | තම පාසලේ සුවිශේෂී ගුණාංගවලට අනුගත ව ශිෂ්‍ය භූමිකාව නිරූපණය කරයි | ■ පාසලේ අනන්‍යතාව<br>■ නිල ඇඳුම<br>■ නිල ඇඳුමේ ප්‍රමිතිය<br>- චාම්බව<br>- සමානබව<br>- ක්‍රමානුකූලබව<br>■ නිල ලාංඡනය<br>- වර්ණ<br>- සංකේත<br>■ පාසල් කොඩිය<br>- වර්ණ<br>- සංකේත<br>- කොඩිය ඔසවන අවස්ථා<br>■ පාසල් ගීතය<br>■ ආදර්ශ පාඨය සහ එමගින් අර්ථවත් වන අදහස | ■ පාසලේ අනන්‍යතාව හඳුනා ගැනීම සඳහා නිල ඇඳුම හා එහි ප්‍රමිතින් උපයෝගීවන ආකාරය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරයි<br>■ පාසලේ නිල ලාංඡනයේ මූලික ප්‍රමිතින් සහ එහි අර්ථය විග්‍රහ කරයි<br>■ පාසල් කොඩියේ සංයුතිය පාසලේ අනන්‍යතාව නිරූපණය කිරීමට දායකවන ආකාරය නිදසුනක් ඇසුරින් විග්‍රහ කරයි<br>■ පාසල් ගීතය තුළින් නිරූපණය වන හරය ඉටු කිරීමට තම දායකත්වය ලබා දිය යුතු ආකාර දෙකක් උදාහරණ ඇසුරින් ඉදිරිපත් කරයි<br>■ ආදර්ශ පාඨයේ අර්ථය සාක්ෂාත්කරණයෙහිලා ශිෂ්‍ය වගකීම් හා යුතුකම් අවස්ථා තුනක් ඇසුරින් ආදර්ශනය කරයි | ■ තම පාසලේ අනන්‍යතා සහ සුවිශේෂී ගුණාංග ආසන්න වෙනත් සහෝදර පාසලක් සමග සන්සන්දනය කරමින් විද්‍යුත් සමර්පණයක් (Electronic Presentation) / නිර්මාණාත්මක ක්‍රමවේදයක් මගින් ඉදිරිපත් කිරීම<br>■ පාසල් දෙකෙහි අනන්‍යතා ලක්ෂණය සංසන්දනාත්මක ව ගැලපීම<br>■ පාසල් දෙකෙහි මූලික සංස්කෘතිකාංග සංසන්දනාත්මක ව ගැලපීම<br>■ නිර්මාණශීලි ව ඉදිරිපත් කිරීම<br>■ දත්ත හා තොරතුරුවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකබව<br>■ සාමූහික ව කටයුතු කිරීම |

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| | තම පාසල හා අන්‍ය පාසල්වල සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමේ වැදගත්කම අගය කරයි | පාසලේ සංස්කෘතිය<br>- පාසලේ පවතින නීති රීති සම්ප්‍රදායන්, අගයයන් සිරිත් විරිත් ආචාර සමාචාර විධි<br>- තම ආසන්න පාසල්වල සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම<br>- තම පාසලේ මෙන්ම අන්‍ය පාසල්වල සංස්කෘතික අනන්‍යතාවයට හා විවිධත්වයට ගරු කිරීමේ ශිෂ්‍ය කාර්යභාරය | ■ පාසලේ සංස්කෘතියට අයත් මූලිකාංග තුනක් උදාහරණ සහිත ව ඉදිරිපත් කරයි.<br>■ පාසලේ පවතින පොදු නීති අනුගමනය කිරීමේ ශිෂ්‍ය වගකීම ඉටු කරන ආකාරය උදාහරණ තුනක් සහිතව වාචික ව ඉදිරිපත් කරයි.<br>■ පාසලට අනන්‍ය වූ ආචාර සමාචාර විධි අනුගමනය කරන ප්‍රධාන අවස්ථා ආදර්ශනය කරයි.<br>■ තෝරාගත් පාසලේ සංස්කෘතික අනන්‍යතාව තම පාසලේ සංස්කෘතික අනන්‍යතාවෙන් වෙනස්වන ආකාරය කරුණු තුනක් ඇසුරින් විග්‍රහ කරයි. | |
| | පාසලේ සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන භූමිකා සතු වගකීම් සහ යුතුකම්වල වැදගත්කම අගය කරයි | ■ පාසල් සංවිධාන ව්‍යුහය<br>- පාසලේ සංවිධාන ව්‍යුහය (තම පාසලට අදාළ ව)<br>■ පාසලේ සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන භූමිකා හා කාර්යභාරය<br>- විදුහල්පති සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>- ශිෂ්‍යයින්<br>- අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ■ පාසලේ සංවිධාන ව්‍යුහයට අයත්වන ප්‍රධාන පුද්ගල කණ්ඩායම් නම් කරයි.<br>■ පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් භූමිකාවල ප්‍රධාන කාර්යයන් සහ වගකීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරයි. | ■ පාසලේ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීමට පාසල් ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස කටයුතු කළ හැකි ආකාරය පිළිබඳ ව කතන්දරයක් කණ්ඩායම් වශයෙන් පන්තියට ඉදිරිපත් කරන්න. එම කතන්දරයට චරිත තුනක්වත් ඇතුළත් කළ යුතුය. |

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| | | පාසලේ අභිවෘද්ධිය සඳහා ශිෂ්‍යයකු සතු යුතුකම් හා වගකීම්<br>උදා:<br>- පාසලේ නීතිරීති සම්ප්‍රදායන්ට අනුගතවීම<br>- පාසලේ ගෞරවය සහ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම | ■ පාසලේ අභිවෘද්ධිය සඳහා ශිෂ්‍යයකු ලෙස තම යුතුකම් හා වගකීම් ඉටු කළ හැකි අවස්ථා පහක් ආදර්ශනය කරයි<br>■ පාසලේ ගෞරවය සහ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීමට ශිෂ්‍යයකු වශයෙන් කටයුතු කළ හැකි ආකාරය අවස්ථා තුනක් සම්බන්ධ උදාහරණ ඇසුරින් විග්‍රහ කරයි | උදාහරණ සහිත ව පහත කරුණු ඇතුළත් වන සේ නිර්මාණය කිරීම<br>■ පාසලේ කීර්තිනාමය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාමාර්ග අන්තර්ගතවීම<br>■ ඉදිරිපත් කළ ක්‍රියාමාර්ගවල උචිත බව<br>■ නිර්මාණශීලිබව<br>■ ඉදිරිපත් කිරීමේ කුසලතා |
| | පාසලේ අභිවෘද්ධියට උපකාරී වන අභ්‍යන්තර හා බාහිර ප්‍රජාව දායකත්වය ලබා දෙන ක්‍රියාකාරකම්වලට සහය වෙයි | - පාසලේ පැවැත්මට අභ්‍යන්තර හා බාහිර ප්‍රජාවගේ දායකත්වය<br>- බාහිර ප්‍රජාව හඳුනා ගැනීම<br>- ආදි ශිෂ්‍යයින්<br>- දෙමාපියන්<br>- ආයතන හා සංවිධාන<br>- සුභ පතන්නන්<br>- ප්‍රදේශවාසීන්<br>ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී පාසලේ සංවර්ධනයට දායක විය හැකි ආකාරය | ■ පාසලේ පැවැත්මට සහය වන අභ්‍යන්තර සහ බාහිර ප්‍රජාවවෙන් වෙන් ව ඉදිරිපත් කරයි<br>■ ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී පාසලේ සංවර්ධනයට දායක විය හැකි ආකාරය ක්ෂේත්‍ර තුනක් ඇසුරින් ආදර්ශනය කරයි | අනාගතයේ දී ඔබ, ආදි ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස පාසලේ සංවර්ධනයට සාමූහික ව දායක විය හැකි ආකාරය පිළිබඳ ව පන්තිය ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත කතාවක දළ සටහනක් පිළියෙළ කිරීම<br>■ අදහස්වල ඵලදායීබව<br>■ ප්‍රායෝගිකබව<br>■ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා අදාළවීම<br>■ පාසලේ අනන්‍යතාව ආරක්ෂා වීමට හේතුවීම<br>■ සාමූහික ව ඉටු කර ගැනීමට හැකිවීම |

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| | අනාගත පාසලේ ස්වභාවය මනසින් ගොඩනගයි | ■ ඔබ දකින අනාගත පාසල<br>- හරිත පාසල (Green school)<br>තිරසර සංවර්ධනය උදෙසා පාසල් වියේ සිට ම සිසුන් තුළ පරිසර හිතකාමී දැනුම්, ආකල්ප හා ව්‍යවහාර ප්‍රගුණ කිරීම සහ අඛණ්ඩ ව සංවර්ධනය කිරීමට පාසල් පරිසරය සැකසීම<br><br>- ක්ෂිතිජ පාසල : අතත්‍ය පාසල (Virtual School)<br>සාමාන්‍ය පාසලක දෛනික ව සිදුවන ක්‍රියාකාරකම් විශ්වීය අවකාශය භාවිතයට ගනිමින් සිසුන් හා ගුරුවරුන් යන දෙපාර්ශවය ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම, ජාත්‍යන්තර වශයෙන් සිදුවන දැනුම් නිර්මාණය, හුවමාරුව වැනි සමස්තය<br><br>උදා: මාර්ගගත අධ්‍යාපනය | ■ අනාගත පාසලේ සහ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වභාවය මනසින් (Imagine) ගොඩ නගා චිත්‍රණය කරයි.<br>■ හරිත පාසලක් ලෙසින් තම පාසල සංවර්ධනය කිරීම සඳහා වන අනාගත දායකත්වය ලබා දිය හැකි ආකාර තුනක් ඉදිරිපත් කරයි<br>■ අතත්‍ය පාසලේ ස්වභාවය හා ක්‍රියාකාරකම් සකස්වන ආකාරය රූපික ව නිරූපණය කරයි. | ■ අනාගතයේ දී මගේ පාසලේ භෞතික සහ මානව සම්පත්වල වෙනස්වීම් මනසින් (Imagine) ගොඩ නගා ගෙන "මා දකින අනාගත පාසල" චිත්‍රයට නැගීම<br>■ සංකල්පය නිවැරදි ව වටහා ගැනීම<br>■ සිතා ගැනීම ප්‍රායෝගිකත්වයෙන් යුක්තවීම<br>■ නිර්මාණශීලිබව<br>■ ඉදිරිපත් කිරීමේ කුසලතා |

| තේමාව (Theme) | ඉගෙනුම් පල (Learning outcomes) | නිර්දිෂ්ට පෙළ (Content) | කාර්යසාධන ප්‍රමිති (Performance Standards) | තක්සේරුකරණය හා තක්සේරු නිර්ණායක (Assessment & Assessment Crietria) |
|---|---|---|---|---|
| | තමා පිළිබඳ ව මතුකර ගත් අනාවරණ ඇසුරින් තම අනාගත ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාත්මක කරයි | තමා හඳුනා ගැනීම්, තම හැකියා, ලැදියා, දක්ෂතා ඔස්සේ තම අනාගත ඉලක්ක සපුරා ගැනීමට පාසල තුළ ඇති අවස්ථා යොදා ගැනීම<br>- ශිෂ්‍යයකු වශයෙන් කටයුතු කිරීමේ දී තමාට පවතින බාධා හා තර්ජන හඳුනා ගැනීම<br>- ඒවා සාර්ථක ව ජය ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය<br>- තවදුරටත් සංවර්ධනය කර ගත යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ එම ක්ෂේත්‍ර සංවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග | ■ ස්වයං ගවේෂණයේ යෙදීමෙන් හඳුනාගත් තම සුවිශේෂී හැකියා සහ ලැදියා ප්‍රමුඛතාගත කරයි<br>■ අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා පාසල තුළ ඇති අවස්ථා ඇසුරින් තම දක්ෂතා සංවර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කරයි<br>■ ශිෂ්‍යයකු වශයෙන් තමාට පවතින බාධා හා තර්ජන සාර්ථක ව ජය ගැනීමට පාසල තුළ ඇති විකල්ප අවස්ථා තුනක් යොදා ගන්නා ආකාරය විග්‍රහ කරයි. | තමා පිළිබඳ ව අනාවරණ මතු කර ගැනීම සඳහා "ශදුඅත" (SWOT) විශ්ලේෂණයක් සිදු කිරීම<br>■ ශක්තීන් හඳුනා ගැනීම හා ඒවායේ පැහැදිලිබව<br>■ දුර්වලතා හඳුනා ගැනීම, ඒවායේ පැහැදිලිබව සහ යෝජනා ඉදිරිපත් කර තිබීම<br>■ අවස්ථා පැහැදිලි ව හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය<br>■ තර්ජන පැහැදිලි ව හඳුනා ගැනීම ඒවා ජය ගැනීමට යෝජනා ඉදිරිපත් කර තිබීම<br>■ නිර්මාණශිලී ව ඉදිරිපත් කිරීම |

**මොඩියුලය 01 - පළමු වාරය**

ක්‍රියාකාරකම් 01 - පාසල හඳුනාගනිමු.

ඉගෙනුම් පල - තම පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇසුරින් පාසල් පැතිකඩ නිර්මාණය කරයි.

කාලය - කාලච්ඡේද 02 යි

**පළමු ක්‍රියාකාරකම මෙහෙයවීම සඳහා ගුරු උපදෙස්**

- පළමු ක්‍රියාකාරකමෙහි නිරතවීමට පෙර සුදුසු පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම්වලට වෙන් කර පාසලේ නිරීක්ෂණ චාරිකාවක නිරත වන්න.
- නිරීක්ෂණ චාරිකාව ඇසුරින් සිසුන් වෙත අත්කර දිය යුතු පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු, පාසලෙන් ඉටු වන සේවය ආදිය විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති හෝ වෙනත් බලය පැවරූ ගුරුභවතෙකු මගින් ලබාදීමට පූර්වයෙන් සැලසුම් කර ගන්න.
- පාසල් නිරීක්ෂණ චාරිකාව ඇසුරින් කණ්ඩායම් විසින් රැස් කර ගත් තොරතුරු පාදක කර ගෙන පහත කරුණු ඉස්මතු වන සේ කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාසලෙන් සිදුවන කාර්යභාර්ය සහ පාසලෙන් අපට ලැබෙන දේ**

1. දැනුම හා අත්දැකීම් ලබාදීම සහ බුද්ධිමය කුසලතා සංවර්ධනය කිරීම
2. සංස්කෘතිය පවරාදීම
3. සමාජ පුද්ගලයින් අතර අන්‍යෝන්‍ය සුහදතාවය තහවුරු කිරීමට දායකවීම
4. ශිෂ්‍යයා සමාජයට අවශ්‍ය පරිදි හැඩගැස්වීම
5. සමාජ පැවැත්ම තහවුරු කිරීම සඳහා සාමූහික බව, පිළිගැනීම, ගරුකිරීම වැනි ගුණාංග වැඩි දියුණු කිරීම

**සෙසු ආයතන හා සැසඳීමේ දී පාසලේ ඇති සුවිශේෂත්වය**

විධිමත් සංවිධානයක (School as a Formal Organization) ලක්ෂණ පිළිබිඹුවීම

උදා:

1. පැහැදිලි ව සකසන ලද සංවිධාන ව්‍යුහයක් පැවතීම
2. සියලු ම සාමාජිකයන්ට කාර්යයන් පවරා තිබීම
3. පාසලේ කටයුතු ක්‍රමානුකූල ව සිදු කිරීම
4. පැහැදිලි නීතිරීති පැවතීම
5. පාසලේ පැවැත්ම දිගුකාලීනවීම
6. පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් සියලු දෙනා කැපවීම

**1. පාසල යනු කුමක් ද ?**

ශිෂ්‍යයකු පූර්ණ පෞරුෂයක් සහිත යහපුරවැසියකු බවට පත් කිරීමේ මූලික කාර්යභාරය ඉටු කරනු ලබන ආයතනය පාසලයි.

පළමු ක්‍රියාකාරකම සිදු කිරීමට ප්‍රථම පාසලෙන් ඉටුවන කාර්යය ඉස්මතු කරමින් ස්වයං අර්ථකතනයක් ගොඩනගා ගැනීම සඳහා ශිෂ්‍යයාට අවශ්‍ය මග පෙන්වීම් සිදු කරන්න.

- කණ්ඩායම සාකච්ඡාව සිදු කර අවසන් වූ පසු 'විධිමත් සංවිධානයක් ලෙස පාසල' මැයෙන් කණ්ඩායම් අනාවරණයක් ගොඩනැගීමට සිසුන්ට මග පෙන්වන්න.

- පියවර 3 යටතේ දක්වා ඇති පාසල පිළිබඳ මූලික තොරතුරු ඇසුරින් දී ඇති ආකෘතිය සම්පූර්ණ කරන්න.

- පාසල පිළිබඳ මූලික තොරතුරු හා පසුබිම් තොරතුරු, පාසලේ වර්තමාන ස්වභාවය, එහි අනන්‍යතා ලක්ෂණ ආදී දෑ ඇතුළත් කර පාසල් පැතිකඩ නිර්මාණය කිරීමට සිසුන්ට සහය වන්න.

- සිසුන් විසින් නිර්මාණය කරන ලද පාසල් පැතිකඩ පහත දී ඇති නිර්ණායක මූලික ව ගොඩනගන ලද රූබ්‍රික් සටහන අනුසාරයෙන් තක්සේරුවට ලක් කරන්න.

| නිර්ණායක | ප්‍රවීණතාව | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| විධිමත් සංවිධානයක ලක්ෂණ පාසල තුළ පිළිබිඹු වන ආකාරය අන්තර්ගත ව තිබීම | පහත සඳහන් කරුණු/ සමාන කරුණුවලින් හතරක් දැක්වීම<br>■ සංවිධාන ව්‍යූහයක් පැවතීම<br>■ කාර්යයන් පවරා තිබීම<br>■ කටයුතුවල ක්‍රමානුකූලබව<br>■ පැහැදිලි නීති රීති<br>■ දිගුකාලීන පැවැත්ම<br>■ අභිවෘද්ධිය සඳහා කැපවීම | පහත සඳහන් කරුණු/ සමාන කරුණුවලින් තුනක් දැක්වීම<br>■ සංවිධාන ව්‍යූහයක් පැවතීම<br>■ කාර්යයන් පවරා තිබීම<br>■ කටයුතුවල ක්‍රමානුකූලබව<br>■ පැහැදිලි නීති රීති<br>■ දිගුකාලීන පැවැත්ම<br>■ අභිවෘද්ධිය සඳහා කැපවීම | පහත සඳහන් කරුණු/ සමාන කරුණුවලින් දෙකක් දැක්වීම<br>■ සංවිධාන ව්‍යූහයක් පැවතීම<br>■ කාර්යයන් පවරා තිබීම<br>■ කටයුතුවල ක්‍රමානුකූලබව<br>■ පැහැදිලි නීති රීති<br>■ දිගුකාලීන පැවැත්ම<br>■ අභිවෘද්ධිය සඳහා කැපවීම | පහත සඳහන් කරුණු/ සමාන කරුණුවලින් එකක් දැක්වීම<br>■ සංවිධාන ව්‍යූහයක් පැවතීම<br>■ කාර්යයන් පවරා තිබීම<br>■ කටයුතුවල ක්‍රමානුකූලබව<br>■ පැහැදිලි නීති රීති<br>■ දිගුකාලීන පැවැත්ම<br>■ අභිවෘද්ධිය සඳහා කැපවීම |
